# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2043/14 - 2017 ඔක්තෝබර් මස 30 වැනි සඳුදා - 2017.10.30**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*යොමු අංකය*: 3/7/14/2.
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය*: 04-3/8/2012/පීසී/236.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර* :

මධ්‍යම පළාතේ නුවරඑළිය දිස්ත්‍රික්කයේ, වලපනේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ඔයපළාත කෝරලේ 515 බී, වලපනේ ග්‍රාම නිලධාරී වසමේ, වතුමුල්ල ගමේ පිහිටි නු/3134 පිඹුරේ පෙන්වා දී ඇති ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0169ක් වන කැබලි අංක 01 න් පෙන්වා දී ඇති ඉඩම්:

**01. කැබලි අංක 01**
ඉඩමේ නම: මුල්හල්කැලේ වත්ත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන්නා: ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව; ඉඩම් පරිහරණය: ගෙවත්ත, ස්ථිර ගොඩනැගිල්ලක කොටසක් ඇත; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0169

ඉහත සඳහන් ඉඩමට, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2017 දෙසැම්බර් මස 20 වැනි දින පූ. භා. 10.00ට වලපනේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී මා සම්මුඛ විය යුතුය.

තවද 2017 දෙසැම්බර් මස 06 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

අයි. එම්. සේනානායක,
ප්‍රාදේශීය ලේකම්,
වලපනේ.

2017 ඔක්තෝබර් මස 15 වැනි දින,
වලපනේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

11-682


1A - G 26495 - 19 - (2017/10)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.